# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1460/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 22/11/2023<br>පැය 1650 |

## මාධ්‍ය නිවේදනය

**01. දියේ ගිලී පුද්ගලයන් දෙදෙනෙකු මිය යාම - ගල්ගමුව පොලිස් වසම.**

2023.11.22 වන අද දින දහවල් කාලයේ ගල්ගමුව පොලිස් වසමේ සියඹලන්ගමුව වැවේ ගිලීමෙන් පුද්ගලයින් දෙදෙනෙකු මිය ගොස් ඇති බවට ගල්ගමුව පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුවන් අවුරුදු 20 සහ 49 වයස්වල පසුවන උස්ගලසියඹලන්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෙම දිනවල පවතින අධික වර්ෂාව හේතුවෙන් සියඹගන්ගමුව වැව වාන් දමමින් පවතින අවසථාවේ, ඉහත පුද්ගලයින් දෙදෙනා වැවේ පිටවාන ආසන්නයේ මසුන් ඇල්ලීමට ගොස් සිටියදී මෙලෙස දියේ ගිලී මියගොස් ඇති බවට සිදුකළ විමර්ශනයේදී අනාවරණය වි ඇත. ගල්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. ගොඩනැඟිල්ලකින් වැටී පුද්ගලයෙකු මිය යාම - වැල්ලවත්ත පොලිස් වසම.**

2023.11.21 වන දින රාත්‍රී කාලයේ වැල්ලවත්ත පොලිස් වසමේ රුද්‍රා මාවත ප්‍රදේශයේ දී ගොඩනැඟිල්ලකින් පහලට වැටී පුද්ගලයෙකු මිය ගොස් ඇති බවට වැල්ලවත්ත පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 20 ක් වන වැල්ලවත්ත රුද්‍රා මාවත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තම මව සහ පියා සමඟ මහල් නිවාස සංකීර්ණයක පදිංචි වී සිට ඇති අතර එම නිවාස සංකීර්ණයේ පිටුපස කොටසට වැටී සිටියදී මෘත ශරීරය හමු වී ඇත. මහේස්ත්‍රාත් පරීක්ෂණය හා පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු මෘත දේහය ඥාතීන්ට භාර දී ඇත. වැල්ලවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පූනෑව පොලිස් ස්ථානය.

2023.11.21 වන දින දහවල් කාලයේ පූනෑව පොලිස් වසමේ ඇහැලගහවංගුව ප්‍රදේශයේ දී පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරන බවට පූනෑව පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු ලබාගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු කැණීම් උපකරණ සමග අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වන පූනෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

එම ස්ථානයේ සිටි අනෙක් සැකකරුවන් පලාගොස් ඇති අතර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා පූනෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - අනුරාධපුරය පොලිස් වසම.

2023.11.21 වන දින සවස් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ ගුවන්තොටුපල මාර්ගයේ අනුරාධපුර දෙස සිට නෙළුම්කුලම දෙසට ධාවනය වූ ලොරි රථයක් කාර්මික දෝෂයක් හේතුවෙන් ගුවන්හමුදා කඳවුර අසල මාර්ගයේ වම්පස අයිනේ නවතා තිබියදී එම දිශාවටම ධාවනය කළ යතුරුපැදියක් පැදිකරුට වේගය පාලනය කර ගැනීමට නොහැකිව ලොරි රථයේ ගැටීමෙන් අනතුරක් සිදු වී ඇත. අනතුරින් පැදිකරු බරපතල තුවාල ලබා අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 52 ක් වූ අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** අනුරාධපුර පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**